# වැලිමඩ ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීම් වාර්තාව - 2025.11.27

**පිළිගැනීම**

2025 වර්ෂයේ නොවැම්බර් මස 27 වන බ්‍රහස්ප්‍රතින්දා දින පෙ.ව.09.00 ට මුලාසනය දැරූ ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රී මණ්ඩලය , සභා ලේකම්තුමා , කාර්ය මණ්ඩලය ඇතුළු සියළු දෙනා පිළිගැනීමෙන් අනතුරුව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

**පැමිණීම**

**සහභාගි වූ ගරු මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනය**

1. ගරු සභාපති ඩී.එම්. අජිත් කුමාර මැතිතුමා
2. ගරු උපසභාපති එම්.එල්.එම්. සෆ්වාන් මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්.ඉන්දික සම්පත් මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.දයාරත්න මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්.ප්‍රභාත් රවීන්ද්‍ර ගුණසේකර මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.කරුණාරත්න මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.එන්.කුසුම් කුමාරි මැතිණිය
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටි.එම්.චන්ද්‍රිකා තෙන්නකොන් මැතිණිය
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ප්‍රියන්ත චාමින්ද මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. මහේෂ් කෝසල රාජකරුණා මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. සරත් කුමාර රාජපක්ෂ මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.දුෂාන්ත ඉන්දික රන්දෙණිය මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ. චන්දක වීරසේන මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.කේ. ලලිත් පද්මසිරි විජය නන්ද මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. උදයකුමාර් මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී. චිත්‍රා ජයසිංහ පතිරණ මැතිණිය
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.එම්.පී.ජමිත් මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්. චාමලී තුෂාරිකා ප්‍රනාන්දු මැතිණිය
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ධනුෂ්ක තිලකසිරි මැතිතුමා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එනස්ට් ඩෙන්සිල් ස්ලේඩන් මැතිතුමා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. චන්ද්‍රසේකර මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.එම්. කරුණාදාස මැතිතුමා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. චාමර ප්‍රසාද් ගුණසේකර මැතිතුමා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. එම්. හුසෙයින් මැතිතුමා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ඥානපාල සේනාධීර මැතිතුමා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්. ප්‍රේමරත්න මැතිතුමා
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. මුත්තුකුමාර් මැතිතුමා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්. පත්මිණී දිසානායක මැතිණිය
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සිත්ති උසෙයිමා මැතිණිය
30. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. වසන්ත කුමාරන් මැතිතුමා
31. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එච්. අබ්දුල් හසීම් මැතිතුමා
32. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. සිසිර දිලාන් ජයතිලක මැතිතුමා
33. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී. චූලනී ජයමාලි මැතිණිය
34. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.සෝමසිරි බණ්ඩාර මැතිතුමා
35. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ශාන්තා ප්‍රසාදි දේශානි මැතිණිය
36. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. කුසුමාවතී මැතිණිය

**නොපැමිණි**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහොමඩ් හලිම් මොහොමඩ් ෆායිස් සයිබු මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.අජිත් ප්‍රේමලාල් මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රාසීක් මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. දනිෂා මැතිණිය
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. තාහිර් මහරූෆ් මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ජබාර් තුවාන්කාසිම් මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.ඩී. අමිත අමරසූරිය මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ඉන්දික සේනාරත්න මැතිතුමා

**ගරු සභාපති ඩී.එම්.අජිත් කුමාර මැතිතුමා**

පවතින අයහපත් කාලගුණය හේතුවෙන් මේවන විට වැලිමඩ බල ප්‍රදේශය තුළ සිදු වී ඇති බැවින් අද දින සැලකිය යුතු මන්ත්‍රීවරුන් පිරිසකට සභාවට පැමිණීමට නොහැකි වී ඇති බැවින් එම ගරු මන්ත්‍රීතුමන්ලාගේ හා තුමියන්ලාගේ නිවාඩු අනුමත කිරීමට පසුව ඉල්ලුම් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.එසේම මේ වන විට බදුල්ල දිස්ත්‍රික්කය තුළ මරණ 15ක් පමණ සිදු වී ඇති අතර අප බල ප්‍රදේශය තුළද ආපදා තත්ත්වයන්ට මුහුණ දී ඇත. එමෙන්ම ඔබතුමන්ලාගේ පැත්තෙන් ග්‍රාම සේවා මට්ටමින් ආපදාවන් සිදු වී ඇත්නම් අප දැනුවත් කරන ලෙස ඉල්ලා සිටිනවා.තවද වැලිමඩ ප්‍රාදේශීය ලේකම්තුමාගේ මූලිකත්වයෙන් මේ වන විට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයක් බල ප්‍රදේශය තුළ ස්ථාපිත කර එහි ආපදාවන්ට ලක් වූ පිරිස් රැදී සිටිනවා.එම නිසා ඒ සම්බන්ධව කටයුතු කිරීමට තිබෙන බැවින් අද දින සභාවේ කටයුතු ඉක්මණින් අවසන් කර ගැනීමට කටයුතු සිදු කර ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා.

**අ. පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරිම .**

ගරු සභාපතිතුමා විසින් පසුගිය සභා වාර්තාව සංශෝධන ඇත්නම් ඉදිරිපත් කර සභා සම්මත කර ගන්නා ලෙස ඉල්ලා සිටින ලදි.

ඒ අනුව පහත ආකාරයෙන් සංශෝධනය සටහන් කරන ලදි.

I. **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.සෝමසිරි බණ්ඩාර මැතිතුමා**

සභා වාර්තාවේ පිටු අංක 24 හි ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් දැක්වීමේදී මාගේ ප්‍රකාශය ජාතික ජනබල වේගයේ ශෝකය ලෙස සටහන් වී ඇති අතර එය සමගි ජනබල වේගයේ ශෝකය ලෙස සංශෝධනය වියයුතු බව මා ප්‍රකාශ කර සිටිනවා. එබැවින් එය සංශෝධනයක් ලෙස සටහන් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති ඩී.එම්.අජිත් කුමාර මැතිතුමා**

ඒ අනුව සංශෝධනයන්ට යටත්ව වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව 2025.10.30 දින මහ සභා වාර්තාව **ගරු මන්ත්‍රී ඊ.චන්දක වීරසේන** මැතිතුමාගේ හා **ගරු මන්ත්‍රී ජී.ධනුෂ්ක තිලකසිරි** මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**ආ. ගරු සභාපතිතුමා විසින් කරන ලද නිවේදන - නැත.**

**ඇ. ප්‍රාදේශීය සභාව අමතා එවන සන්දේශ/පැමිණිලි/පෙත්සම්/සන්නිවේදන ලිපි - නැත**

**ඈ. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත.**

**ඉ. යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ගරු සභාපතිතුමාගේ යෝජනා**

**ඉ.(1)**

**<u>වැලිමඩ නව වෙළඳ සංකීර්ණයේ අංක 23 දරණ කඩ කාමර පැවරීම</u>**

2025.11.11 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවෙහි අංක 02 දරණ නිර්දේශය පරිදි ගිවිසුමේ 10 හා 28 වගන්ති ප්‍රාකාරව හා දැනට සභාව අනුමත කර ඇති පැවරුම් ගාස්තු වන රු.300,000.00ක මුදල අයකර අංක 103,බදුල්ල පාර,වැලිමඩ යන ලිපිනයෙහි පදිංචි ආර්.එම්.ගගනි කල්හාර මිය (ජා.හැ.අංක 885400221V) වෙත මෙකී කඩ කාමරයේ බදු අයිතිය පවරා දීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.චන්ද්‍රසේකර මහතා විසින් ස්ථිර කරන ලදි.**

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.11.27 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.(2)**

**<u>වැලිමඩ නව වෙළඳ සංකීර්ණයේ අංක 29 දරණ කඩ කාමරය පැවරීම</u>**

2025.11.11 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවෙහි අංක 03 දරණ නිර්දේශය පරිදි ගිවිසුමේ 10 හා 28 වගන්ති ප්‍රාකාරව හා දැනට සභාව අනුමත කර ඇති පැවරුම් ගාස්තු වන රු.300,000.00ක මුදල අයකර අංක 103,බදුල්ල පාර,වැලිමඩ යන ලිපිනයෙහි පදිංචි ආර්.එම්.ගගනි කල්හාර මිය (ජා.හැ.අංක 885400221V) වෙත මෙකී කඩ කාමරයේ බදු අයිතිය පවරා දීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.එම්.කරුණාදාස මහතා විසින් ස්ථිර කරන ලදි.**

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.11.27 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.(3)**

**<u>වාර්ෂික බදු පදනම මත දෙනු ලබන දේපල සඳහා වන ගිවිසුම් කෙටුම්පත් සඳහා අනුමැතිය ලබා ගැනීම</u>**

2025.11.11 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවෙහි අංක 04 දරණ නිර්දේශය පරිදි 2026 වර්ෂය සඳහා වාර්ෂික බදු පදනම මත දෙනු ලබන දේපල සඳහා සකස් කර ඇති පහත සඳහන් ගිවිසුම් කෙටුම්පත් පිළිගැනීමටත් ,ඒ අනුව ගිවිසුම් ගත වීම සුදුසු බවටත්, මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

I. රථ වාහන නැවතීමේ ගාස්තු අය කිරීමේ අයිතිය වාර්ෂිකව බදු දීම සඳහා වූ ගිවිසුම් කෙටුම්පත
II. පොදු වැසිකිලිය සඳහා වූ ගිවිසුම් කෙටුම්පත
III. මස්,මාළු,කුළු බඩු හා ගබඩා පහසුකම් සඳහා වන කඩ කාමරවලට සකස් කරන ලද ගිවිසුම් කෙටුම්පත

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ප්‍රේමරත්න මහතා විසින් ස්ථිර කරන ලදි.**

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.11.27 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.(4)**

**<u>වැලිමඩ නව වෙළඳ සංකීර්ණයේ අංක 16 දරණ කඩ කාමරය පැවරීම</u>**

2025.11.11 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවෙහි අංක 07 දරණ නිර්දේශය පරිදි ගිවිසුමේ 10 හා 28 වගන්ති ප්‍රාකාරව හා දැනට සභාව අනුමත කර ඇති පැවරුම් ගාස්තු වන රු.300,000.00ක මුදල අයකර අගලපස්ස,පන්සල පාර,වැලිමඩ යන ලිපිනයෙහි පදිංචි එම්.එස්.පැට්‍රිෂියා මිය (ජා.හැ.අංක 197759101700) වෙත මෙකී කඩ කාමරයේ බදු අයිතිය පවරා දීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.චන්දක මහතා විසින් ස්ථිර කරන ලදි.**

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.11.27 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.(5)**

**උප කාර්යාලවලට අදාළ කඩ කාමර සඳහා 2026 වර්ෂයට තක්සේරු කර ඇති තක්සේරු ගාස්තු අයකර ගැනීම**

2025.11.11 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවෙහි අංක 08 දරණ නිර්දේශය පරිදි තැන්නෙකුඹුර උප කාර්යාලයට අයත් වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සඳහා අළුත්වැඩියා කටයුතු සිදු කිරීමෙන් අනතුරුව තක්සේරු කර ඇති කුළිය අයකර ගැනීමටත් ,කැප්පෙටිපොළ උප කාර්යාලයට අයත් කඩ කාමර 13 හා බොරලන්ද උප කාර්යාලයට අයත් ගුරුතලාව 5 කණුවේ කඩ කාමර 5 සඳහා අදාළ කුළී මුදල සම්බන්ධයෙන් අදාළ කඩ හිමියන් දැනුවත් කර තක්සේරු දෙපාර්තමේන්තුවෙන් යොමු කර ඇති කුළී මුදල 2026.01.01 වන දින සිට අයකර ගැනීම සුදුසු බවටත්, මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.හුසේන් මහතා විසින් ස්ථිර කරන ලදි.**

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.11.27 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.(6)**

**බොරලන්ද වැලිමඩ පාර අංක (වම)01 දරණ කඩ කාමරය පැවරීම**

2025.11.11 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවෙහි අංක 11 දරණ නිර්දේශය පරිදි මෙම කඩ පැවරීම ඥාති සම්බන්ධතාවයක් මත සිදු වන හෙයින් දැනට සභාව අනුමත කර ඇති පැවරුම් ගාස්තු වන රු.25,000.00ක මුදල අයකර ගිවිසුමේ 26 වගන්තිය ප්‍රකාරව ජයසිරි, වැලිමඩ පාර , බොරලන්ද යන ලිපිනයෙහි පදිංචි ඩබ්.එම්.සම්පත් උදයංග අමරසේකර මහතාට (ජා.හැ.අංක 782892940V) වෙත මෙකී කඩ කාමරයේ බදු අයිතිය පවරා දීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.චාමර ප්‍රසාද් ගුණසේකර මහතා විසින් ස්ථිර කරන ලදි.**

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.11.27 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.(7)**

**කර්මාන්ත ඇස්තමේන්තු සඳහා අනුමැතිය ලබා ගැනීම**

2025.11.11 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවෙහි අංක 21 දරණ නිර්දේශය පරිදි වැලිමඩ බස් නැවතුම්පොළ අසල නව වෙළඳ සැලක් ඉදි කිරීම සඳහා සකස් කර ඇති රු.1,100,000.00ක ඇස්තමේන්තුව පිළිගැනීමටත්, ඒ අනුව එකී කර්මාන්තය සිදු කරවා ගෙන සභා අරමුදලින් ගෙවීම් කිරීම සුදුසු බවටත් මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.චාමලී තුෂාරිකා ප්‍රනාන්දු මිය විසින් ස්ථිර කරන ලදි.**

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.11.27 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.(8)**

**2025 නොවැම්බර් මස මන්ත්‍රී දීමනාව ගෙවීම**

වැලිමඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති, උප සභාපති හා ගරු මන්ත්‍රීතුමන්ලා ,තුමියන්ලා හට 2025 නොවැම්බර් මස මන්ත්‍රී දීමනා වශයෙන් රු.675,000.00ක මුදලක් ප්‍රතිපූර්ණයට යටත්ව සභා අරමුදලින් දැරීමට සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. සරත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදි.**

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.11.27 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.(9)**

**නොවැම්බර් මස දෛනික වැටුප් ගෙවීම 2025**

වැලිමඩ ප්‍රාදේශීය සභාවේ දෛනික සේවයේ නිරත සේවක මහත්ම මහත්මීන් 36 දෙනෙක් සඳහා 2025 නොවැම්බර් මස දෛනික වැටුප් වශයෙන් රු.2,220,992.50ක මුදලක් සභා අරමුදලින් දැරීමට සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. දූෂාන්ත ඉන්දික රන්දෙණිය මහතා විසින් ස්ථිර කරන ලදි.**

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.11.27 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**ඉ. (10)**

**ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.හුසේන් මැතිතුමා විසින් ඉදිරි මාසික සභාවාරයට ඉදිරිපත් කරන ලද යෝජනාව**

ඒ.එම්.හුසේන්,එන්.පී.පී.ප්‍රාදේශීයසභාමන්ත්‍රී,අළුගොල්ල,බෝගහකුඹුර,2025.11.14ගරුසභාපතිතුමා,ප්‍රාදේශීය සභාව,වැලිමඩ.ගරු සභාපතිතුමනි,ඉදිරි මාසික සභාවාරයට ඉදිරිපත් කරනු ලබන යෝජනා. මෙතෙක් ප්‍රාදේශීය සභා පාලනයෙන් ගිලිහී වැලිමඩ කොට්ඨාශය තුළ වූ සුසාන භූමි සඳහා පුනරුද පුරවර තේමාව යටතේ සුසානභූමි සඳහා කරගෙන යන වැඩපිළිවෙල සඳහා පළමුව ගරු සභාපතිතුමාට හා ලේකම්තුමාට මාගේ හෘදයාංග පූර්ව ස්තූතිය පුද කරමි.මාගේ දැනීම අනුව මෙතෙක් ලියාපදිංචි නොවී ඇති සුසානභූමි සම්බන්ධව පරීක්ෂා කර බලා එම සුසානභූමි ලියාපදිංචි සුසානභූමි බවට පත් කර දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි.

(1) ගුරුතලාව හතරෙ කණුව මුස්ලිම් හා සිංහල සුසාන භූමි
(2) පාදිනාවෙල මුස්ලිම් සුසාන භූමි
(3) අලකොලගාල ග්‍රාම නිලධාරි වසමේ ගොරකා පතන කෝවිල් පතන පැල්ගස්තැන්න මුස්ලිම් ජනතාවගේ සුසානභූමිය .පයිනස් වගාව තුළ ඇති අතර ඉඩම වැලිමඩ ප්‍රාදේශීය ලේකම්තුමා නීත්‍යානුකූලව වෙන් කර ඇත.1996 වසරේ සිට මේ දක්වා එහි භූමදාන කරන සුසානභූමියකි.(මෙම සුසානභූමියට අයත් ඉඩමට යාබදව අඹේවෙල වතුයායේ ක්‍රිස්තියානි ජනතාවට සුසානභූමිය සඳහා ඉඩම් කොටසක් වෙන් කර දී ඇත.)
(4) රේන්දපොල අඹේවෙල පාර ගොරකා පතන දමිල ජනතාවගේ සුසානභූමිය.අභාවප්‍රාප්ත පියදාස මුදලාලිගේ නිවස අසල ඉඩම. මෙම සුසානභූමි මාගේ දැනීම අනුව ලියාපදිංචි වීමට ඇති සුසානභූමි බව දන්වා සිටිමි. ස්තූතියි. මෙයට 2025.11.14

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්. රාසික් මහතා විසින් ස්ථිර කරන ලදි.**

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.11.27 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

ඉ. (11)

**ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.මහේෂ් කෝසල රාජකරුණා මැතිතුමා විසින් ඉදිරි මාසික සභාවාරයට ඉදිරිපත් කරන ලද යෝජනාව**

ආර්.එම්.මහේෂ් කෝසල රාජකරුණා, ප්‍රාදේශීය සභා මන්ත්‍රී,දික්කාපිටිය,වැලිමඩ.2025.11.15සභා ලේකම්තුමා ,වැලිමඩ ප්‍රාදේශීය සභාව, වැලිමඩ.දික්කාපිටිය ළමා මාතෘ සායන මධ්‍යස්ථානයට ප්‍රාදේශීය සභාව මඟින් ක්‍රියාත්මක කරන ජල යෝජනා ක්‍රමය මඟින් ජලය ලබා ගැනීම සම්බන්ධව මහ සභාවට කරන යෝජනාවයි.දික්කාපිටිය මාතෘ සායන මධ්‍යස්ථානය වැලිමඩ මහජන සෞඛ්‍ය බල ප්‍රදේශයට අයත් වන අතර එමඟින් දික්කාපිටිය,පුහුල්පොළ හා කොස්කණුවෙල වසම්වල මව්වරුන්ට හා ළමුන්ට අවශ්‍ය ප්‍රධාන සෞඛ්‍ය සේවා සැපයීමට විශාල භූමිකාවක් ඉටු කරයි.නමුත් මේ වන විට ඒම සායන මධ්‍යස්ථානයට ස්ථාවර ජල පහසුකමක් නොමැති බැවින් සායන කටයුතු නිසිලෙස ඉටු කිරීමේදී දැඩි දුෂ්කරතාවයකට මුහුණ දීමට සිදු වී ඇත.මෙය ප්‍රාදේශීය සභා විෂය පථයට අයත් වූ මහජන සෞඛ්‍ය හා සමාජ කටයුත්තක් බැවින් මේවන විට ප්‍රාදේශීය සභාව මඟින් දික්කාපිටිය වසමේ ක්‍රියාත්මක කරනු ලබන ජල යෝජනා ක්‍රමය හරහා දික්කාපිටිය මාතෘ හා ළමා සායන මධ්‍යස්ථානය අවශ්‍ය ජල පහසුකම් ලබා දෙන මෙන් යෝජනා කර සිටිමි. ආර්.එම්.මහේෂ් කෝසල රාජකරුණා, ප්‍රාදේශීය සභා මන්ත්‍රී,දික්කාපිටිය,වැලිමඩ.0777806853

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.චිත්‍රා ජයසිංහ පතිරණ විසින් ස්ථිර කරන ලදි.**

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.11.27 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**කල්තබා දැනුම් දෙනු නොලැබූ යෝජනා අංක 01**

2025.11.26 වන දින රාත්‍රියේ ඇතිවූ අයහපත් කාලගුණික තත්වය හේතුවෙන් වැලිමඩ ගඟ හරහා ඉදිකර ඇති මලාපවහන පද්ධතියේ බට වලට හානි සිදු වී ඇත.එබැවින් එය යථාතත්වයට පත් කිරීම සඳහා සභා අරමුදලින් වියදම් දැරීමටත්, ඊට අදාළ ඇස්තමේන්තුව ඉදිරි සභා වාරයේ ආවරණ අනුමැතියට යටත්ව කටයුතු කිරීමට සුදුසු බවටත් මම යෝජනා කරමි.

එම යෝජනාව **ගරු ප්‍රාදේශීය සභා ජී.ධනුෂ්ක තිලකසිරි මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.
ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.10.30 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**ඊ.කාරක සභා වාර්තා සලකා බැලිම.**

ගරු ප්‍රාදේශීය සභා ගරු සභාපති ඩී.එම්.අජිත් කුමාර මැතිතුමා විසින් කාරක සභා වාර්තාවන්හි සංශෝධන ඇත්නම් ඉදිරිපත් කරන ලෙස පවසා සිටින ලදි.
ඒ අනුව,

I. 2025.11.04 වන දින පැවති පරිසර හා සේවා කමිටු වාර්තාව
II. 2025.11.06 වන දින නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව
III. 2025.11.11 වන දින මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව

ඉහත සඳහන් කාරක සභා වාර්තා සලකා බලන ලද අතර එකී නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට සභාව අනුමත කරන ලදි

**උ. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශන එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා හා සභාගත කළ යුතු වෙනත් ලේඛණ**

2025 ඔක්තෝම්බර් මස ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශන එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව ගරු සභාව විසින් පිළිගන්නා ලදි.

**උ෯ . වෙනත් කරුණු**

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ. මුත්තුකුමාර් මැතිතුමා**

ගරු සභාපතිතුමනි,මේ දිනවල පවතින අධික වර්ෂාව හේතුවෙන් ග්ලෙන්චි වත්තෙහි (පහළ කොටස) ජනතාව ආරක්ෂාවක් නොමැතිව ඊයේ සිට විශාල ගැටළුවකට මුහුණ දී සිටී.එබැවින් එම ජනතාව එක් ස්ථානයකට එක් කර ඔවුන්ට උදව් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති ඩී.එම්.අජිත් කුමාර මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමනි,ග්ලෙන්චි වත්තේ සිරවී සිටි තුන් දෙනෙක් මේ වන විට රෝහල් ගත කර ඇති අතර පට්ටිපොළ පොළිසිය, නුවරඑළිය හමුදා කවුර හා වතු අධිකාරි යන නිලධාරින් මැදිහත් වී එම ප්‍රදේශයේ පිරිස එක් තැනකට එක් කර ආපදා කඳවුරක් බවට පත් කර අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කර තිබෙනවා. එසේම ප්‍රාදේශීය ලේකම්තුමා විසින්ද මෙම ස්ථානය කෙරෙහි නිරන්තරයෙන් අවධානය යොමු කර අවශ්‍ය කටයුතු සිදු කරනවා.

ඉන් අනතුරුව ගරු සභාපතිතුමන් විසින් සහභාගි වූ සියලු මන්ත්‍රීවරුන්ටත් ,කාර්ය මණ්ඩලයටත්, ස්තුතිය පුද කර සිටිමින් මීළඟ මහා සභා රැස්විම 2025 දෙසැම්බර් මස 25 වන දින පැවැත්වීමට නියමිතව තිබුණත් එදින නිවාඩු දිනයක් වන බැවින් දෙසැම්බර් මස මහ සභා රැස්වීම දෙසැම්බර් මස 26 වන සිකුරාදා දින පැවැත්වෙන බවත් , මුදල් හා ප්‍රතිපත්ති කමිටුවුව 2025 දෙසැම්බර් මස 09 වන දින පැවැත්වෙන බවත්, ගරු සභාපතිතුමා විසින් සභාවට දැනුම් දෙමින් සභාවේ වැඩ කටයුතු ප.ව 09. 45 ට පමණ නිමා කරන ලදි.

සභාපති,
ප්‍රාදේශීය සභාව,
වැලිමඩ

\

මෙම සභා වාර්තාව ................................................. වන දින පැවති මහ සභාවේ දි ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී/මන්ත්‍රීණී ....................................................................මැතිතුමා/මැතිණියගේ යෝජනාවෙන් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී/මන්ත්‍රීණී...................................................... මැතිතුමා/මැතිණියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව/බහුතර ඡන්දයෙන් සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.